# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1870/63 - 2014 ජූලි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2014.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/83.

**1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පිළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 23 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද යාපා අබේවර්ධන,
කෘෂිකර්ම අමාත්‍ය.

2014 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1997 පෙබරවාරි 07 වන දින අංක 961/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත 1983 සැප්තැම්බර් 22 වන දින අංක 263/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටරත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 1 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"(අ) 6 වන වගන්තිය යටතේ පිළිබෝධ නාශක බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම සමග පහත දැක්වෙන ආකාරයට වාරික දෙකකින් ගෙවනු ලැබිය යුතු රුපියල් ලක්ෂයක් වූ ගාස්තුවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :-

(i) ආපසු ගෙවනු නොලබන ලිපිගොනු ගාස්තුවක් වශයෙන් වූ රුපියල් හැත්තෑපන් දහසක් ; සහ

(ii) ඉල්ලීම පිළිගැනීමේ දී අයකරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් වශයෙන් වූ රුපියල් විසිපන් දහසක්.

(ආ) සීමාකරන ලද පළිබෝධ නාශක බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම කමිටුවේ අනුමැතියට යටත්ව ලිපිගොනු ගාස්තුවක් වශයෙන් වූ රුපියල් හයදහස් පන්සීයක ගාස්තුවක් සහ ලියාපදිංචි ගාස්තුවක් වශයෙන් වූ රුපියල් හාරදහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) (i) පළිබෝධ නාශක බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් 7 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව වූ ;හෝ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) 7 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් 11 වන වගන්තිය යටතේ අවලංගු කිරීම, අත්හිටුවීම හෝ සංශෝධනය කිරීමට එරෙහිව වූ,

සෑම අභියාචනයක්ම රුපියල් දස දහසක ගාස්තුවක් ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

(2) එහි 2 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"2 (අ) පළිබෝධ නාශක බලපත්‍රයක් අලුත් කිරීම සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක්ම, රුපියල් හාරදහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) වසර හයක් සම්පූර්ණවීමෙන් පසු සිය බලපත්‍රය ලියාපදිංචි කිරීමට අදහස් කරනු ලබන සෑම බලපත්‍ර හිමියකුම රජයේ පර්යේෂණ ආයතනයකින් ජෛව සඵලත්ව සහතිකයක් ලබා ගත යුතු ය.".

(3). එහි 3 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් නියෝග එකතු කිරීමෙන් :-

"4. යම් ලියාපදිංචි පළිබෝධ නාශකයක් ආනයනය කිරීමට අපේක්ෂා කරනු ලබන තැනැත්තකු විසින් රුපියල් දහසක් වූ බලපත්‍ර ගාස්තුවක් ද සමග 17 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමතයක් ලබාගත යුතු ය.

5. (අ) 6 වන වගන්තිය යටතේ පළමුවරට පළිබෝධ නාශක බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරන විට, සෑම ඉල්ලීමක් ම සමග තෙවන පාර්ශව, පරිසරය සහ වනසත්ව සම්පත් ආරක්ෂා කිරීම පිණිස ඇතැම් ද්‍රව්‍ය අලෙවි කිරීමේ දී හෝ බෙදා හැරීමේ දී කිසිදු උපද්‍රවයක් සිදු නොවන බවට සහතික කරමින් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබාගත් ක්ෂේත්‍ර ඇගයුමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වූ ක්ෂේත්‍ර ඇගයුම සඳහා වූ සෑම ඉල්ලීමක්ම පහත දැක්වෙන ආකාරයට වාරික දෙකකින් ගෙවිය යුතු රුපියල් ලක්ෂයක් වූ ගාස්තුවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; එනම්

(i) ආපසු ගෙවනු නොලබන ලිපිගොනු ගාස්තුවක් වශයෙන් වූ රුපියල් පනස් දහසක් ; සහ

(ii) ක්ෂේත්‍ර ඇගයුම සිදුකර ඉල්ලීම පිළිගැනීමේ දී ලියාපදිංචි ගාස්තුවක් වශයෙන් වූ රුපියල් පනස් දහසක ගාස්තුවක් ;

එසේ වුව ද, කමිටුවේ අනුමැතියට යටත්ව (අ) ඡේදය යටතේ වූ ක්ෂේත්‍ර ඇගයුම ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් යම් සීමිත පළිබෝධ නාශක වර්ග ආනයන කරන්නකු නිදහස් කරනු ලැබිය හැකි ය.

එසේම තවදුරටත්, සෑම බලපත්‍ර හිමියකුම විසින්, මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස හයක කාලයක් ඇතුළත මෙම නියෝග ප්‍රකාරව ක්ෂේත්‍ර ඇගයුමක් ලබාගත යුතු ය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස :-

"පනත" යන්නෙන් 1980 අංක 33 දරන පිළිබෝධ නාශක පාලනය කිරීමේ පනත අදහස් වේ.

"ජෛව - සඵලත්ව සහතිකය" යන්නෙන් පළිබෝධකයින් පාලනය කිරීමේ දී පළිබෝධ නාශකයේ සක්‍රීය බව පෙන්නුම් කරමින් අදාළ රජයේ පර්යේෂණ ආයතනයක් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් අදහස් වේ.

"කමිටුව" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත යටතේ පිහිටුවනු ලැබූ පළිබෝධ නාශක තාක්ෂණික සහ උපදේශන කමිටුව අදහස් වේ.

"රජයේ පර්යේෂණ ආයතනය" යන්නෙන් කෘෂි භෝග, මානව හා සත්ව සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා රජය විසින් පිහිටුවනු ලැබූ ආයතනයක් අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත යටතේ පත් කරනු ලැබූ පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ. ".

07-787

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.